**විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව - ශ්‍රී ලංකාව**

**විශ්වවිද්‍යාල ප්‍රවේශ පිළිබඳ සාමාන්‍ය තොරතුරු**

| | |
|---|---|
| අලෙවි නියෝජිතයින් හට අත්පොත ලබා ගත හැකි දිනය | 2025.05.02 |
| සිසුන් හට අත්පොත ලබා ගත හැකි දිනය | 2025.05.03 |
| **අයදුම්පත් කැඳවීම ආරම්භ කරන දිනය** | **2025.05.09** |
| **අයදුම්පත් භාරගන්නා අවසාන දිනය** | **2025.05.30** |

2024/2025 අධ්‍යයන වර්ෂයට අදාළ විශ්වවිද්‍යාල ප්‍රවේශ අත්පොත ලබා ගන්නා ආකාරය :

2024/2025 අධ්‍යයන වර්ෂයට අදාළ විශ්වවිද්‍යාල ප්‍රවේශ අත්පොත පහත දක්වා ඇති ඕනෑම ආකාරයකින් එක් පොතක් සඳහා රු. 1000/= ක මුදලක් ගෙවා ලබා ගත හැකිය.

(අ). අංක 20, වෝඩ් පෙදෙස, කොළඹ 07 යන ස්ථානයේ පිහිටි විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවෙන්.

(ආ). විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් ප්‍රවේශ අත්පොත් අලෙවි කිරීම සඳහා පත්කර ඇති බෙදාහැරීමේ නියෝජිතයන් වෙතින් ලබාගත හැක.

(ඇ). තැපැල් මඟින් ද විශ්වවිද්‍යාල ප්‍රවේශ අත්පොත් ලබා ගත හැකිය.

ඒ සඳහා ලංකා බැංකුවේ ටොරින්ටන් ශාඛාවේ ඇති විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා රැස් කිරීමේ ගිණුම් අංක 0002323287 ට හෝ මහජන බැංකුවේ පුරහල ශාඛාවේ රැස් කිරීමේ ගිණුම් අංක 167-1-001-4-3169407 ට බැර වන සේ, ලංකා බැංකුවේ හෝ මහජන බැංකුවේ ඕනෑම ශාඛාවකට එක් ප්‍රවේශ අත්පොතක් වෙනුවෙන් රු. 1000/= ක් බැගින් ගෙවා ලබා ගත් කුවිතාන්සියක්, ප්‍රවේශ අත්පොත ලබා ගැනීම සඳහා කරන ලිඛිත ඉල්ලීම සමඟ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත එවිය යුතුය. තවද, නියමිත මුදල් ගෙවූ බවට බැංකු ශාඛාවේ මුද්‍රාව තබා බලයලත් නිලධාරියකු විසින් එම බැංකු කුවිතාන්සිය අත්සන් කර තිබිය යුතුය.

එසේ බැංකු කුවිතාන්සියක් එවා ප්‍රවේශ අත්පොත් තැපැල් මඟින් ලබා ගැනීමේදී, අයදුම්කරුගේ නම හා අවශ්‍ය ප්‍රවේශ අත්පොතේ මාධ්‍යය සඳහන් කර තමාගේ ලිපිනය ලියන ලද මුද්දර නොගැසූ 37 cm x 26 cm ප්‍රමාණයේ ලියුම් කවරයක් සමඟ ලිඛිත ඉල්ලීමක් අයදුම්කරුවන් විසින් නියෝජ්‍ය ලේකම්/විශ්වවිද්‍යාල ප්‍රවේශ, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව, අංක 20, වෝඩ් පෙදෙස, කොළඹ 07 යන ලිපිනයට ඉදිරිපත් කළ යුතුය.

ඔබට යම් ගැටළුවක් ඇත්නම් තොරතුරු මධ්‍යස්ථානය අමතන්න .

**011-2695301/011-2695302**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව,
අංක 20, වෝඩ් පෙදෙස,
කොළඹ 07.
2025.04.30